රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:**(94) 011- 2694560** Telephone
ෆැක්ස් தொலைநகல்:**(94) 011- 2692254** Fax
ඊ-මේල් மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/පොදු
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.05.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධ ලිපි යොමු කිරීම</u>**

සංවර්ධන නිලධාරීන්ගේ ආයතනික කටයුතුවලට අදාළව යොමු කරන ලිපි සමඟ එවා ඇති දිවුරුම් ප්‍රකාශ හා නිවාඩු වාර්තා පරීක්ෂා කිරීමේදී එම ලේඛන විවිධ අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන බව නිරීක්ෂණය විය. එබැවින් ඉදිරියේදී දිවුරුම් ප්‍රකාශ හා නිවාඩු වාර්තා යොමු කිරීමේදී ඇමුණුම 01 හා 02 හි සඳහන් ආකෘති පරිදි යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

- ඇමුණුම 01 - නිලධාරියාගේ නමෙහි වෙනසට අදාළව යොමු කරනු ලබන දිවුරුම් ප්‍රකාශය
- ඇමුණුම 02 - නිවාඩු වාර්තාව

02. තවද සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අනුව බඳවා ගැනීමේ සුදුසුකම වන පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හදාරා තිබීමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන සංවර්ධන නිලධාරීන්ගේ උපාධි ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපියෙහි අඩංගු විය යුතු සියලුම තොරතුරු සඳහන් නොවන බැවින්, අදාළ විශ්වවිද්‍යාල වෙතින් එම උපාධි ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපිය, ඇමුණුම 03 හි සඳහන් ආකෘතිය අනුව ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

## දිවුරුම් ප්‍රකාශය

(....නම......) මයා /මෙය/මිය වන මාගේ වයස අවුරුදු (........) හා උපන්දිනය (දි.මා.වර්ෂය) වේ. මා (විවාහක/අවිවාහක), (ශ්‍රී ලාංකික/වෙනත්) පුරවැසියකු බව ද (බෞද්ධ/හින්දු/ඉස්ලාම්/කතෝලික/බර්ගර්) භක්තිකයකු ලෙසද මාගේ ජාතික හැඳුනුම්පත් අංකය (............) හා ලිපිනය (.............) ලෙස ද අවංකව ද සත්‍ය ලෙස ද ගරු ගාම්භීරතා පූර්වකව පහත කරුණු ප්‍රතිඥා දී ප්‍රකාශකර සිටිමි.

01. ඉහත තොරතුරු සඳහන් කරන එමෙන්ම අත්සන් කරනු ලබන ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

02. අංක (..........) දරන (....ලියාපදිංචි අංකය......) දිනැති උප්පැන්න සහතිකයේ මාගේ නම සඳහන් වන්නේ (..සම්පූර්ණ නම - උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි) යනුවෙනි.

03. (නිකුත් කරන ලද දිනය) දිනැති අංක (ජා.හැ.ප. අංකය) දරන ජාතික හැඳුනුම්පතෙහි මාගේ නම සඳහන් වන්නේ (සම්පූර්ණ නම- ජා.හැ.ප. සඳහන් පරිදි) යනුවෙනි.

04. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක (CS/DOS/XXXXX) දරන (පත්වීම අත්සන් කරන ලද දිනය ) දිනැති සංවර්ධන නිලධාරී සේවය - 111 ශ්‍රේණියේ පත්වීම් ලිපියෙහි මාගේ නම සඳහන් වන්නේ (පත්වීම් ලිපියෙහි සඳහන් සම්පූර්ණ නම) යනුවෙනි.

05. (විශ්ව විද්‍යාලය) මඟින් ලබා දී ඇති (අංකය) අංක දරන (දිනය) දිනැති උපාධිය සනාථ කිරීමේ ලිපියෙහි මාගේ නම සඳහන් වන්නේ (සනාථ කිරීමේ ලිපියෙහි සඳහන් සම්පූර්ණ නම) යනුවෙනි.

06. (විශ්ව විද්‍යාලය) මඟින් ලබාදුන් උපාධි විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි මාගේ නම සඳහන් වන්නේ (සම්පූර්ණ නම- විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය ප්‍රකාරව) යනුවෙනි.

07. (වෙනත් ලේඛන) යෙහි මාගේ නම සඳහන් වන්නේ (සම්පූර්ණ නම) යනුවෙනි.

08. ඉහත සඳහන් පරිදි (1 වන නම), (2වන නම), (3වන නම), (4වන නම),……………. ලෙස ද හඳුන්වන්නේ කිහිපදෙනෙකු නොව එක් තැනැත්තෙකු වන (නිවැරදිව භාවිතා කරන සම්පූර්ණ නම) වන මා පමණක් බව හා ඉදිරි සියලුම රාජකාරි කටයුතුවලදී (ඉදිරි රාජකාරී කටයුතුවලදී භාවිතා කිරීමට අපේක්ෂිත නම) ලෙස භාවිතා කරන බවටත් මෙයින් ප්‍රතිඥා දී ප්‍රකාශකර සිටිමි.

ඉහත සඳහන් ප්‍රකාශය දිවුරුම්කරුට වැටහෙන (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) භාෂාවෙන් තේරුම්කර දීමෙන් පසුව එය නිවැරදි බවට පිළිගෙන වර්ෂ (xxxx)මස (xx) (xx)වන දින (දිස්ත්‍රික්කය) දී මා ඉදිරියේදී ඔහු/ඇය ප්‍රතිඥා දී අත්සන් තබන ලදී.

මුද්දරය

ප්‍රකාශකගේ අත්සන

.............................................

සමාදාන විනිශ්වයකාර තැන

නිල මුද්‍රාව

**ඇමුණුම 02**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

ඒකාබද්ධ සේවා අංශය,

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

<u>නිවාඩු විස්තර ලබා දීම</u>

<u>**........................................(CS/DOS/..................) – සංවර්ධන නිලධාරී III ශ්‍රේණිය**</u>

මෙම .......................................................සේවය කරන .......................................................... මෙය/මිය/මයා ............................. දින සිට ..........................දින දක්වා ලබාගත් නිවාඩු පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

| වර්ෂය | නිවාඩු | | | |
|---|---|---|---|---|
| | අනියම් නිවාඩු | විවේක නිවාඩු | අඩවැටුප් (ප්‍රසූත නිවාඩු හැර) | වැටුප් රහිත (ප්‍රසූත නිවාඩු හැර) |
| 2013 | | | | |
| 2014 | | | | |
| 2015 | | | | |
| 2016 | | | | |
| 2017 | | | | |
| 2018 | | | | |
| 2019 | | | | |
| 2020 | | | | |
| 2021 | | | | |

නිලධාරියා ඉකුත් නිවාඩු ලෙස පූර්ව වර්ෂවල ඉතිරි කරගත් විවේක නිවාඩු ලබාගෙන තිබේ නම් ඒ පිළිබඳ විස්තර
.....................................................................................................................................................
.....................................................................................................................................................
...................................................................................................................................................

......................                                                    ........................................................................

දිනය                                                    දෙපාර්තමේන්තු ප්‍රධානීයාගේ අත්සන හා නිලමුද්‍රාව

**සටහන -** නිවාඩු වාර්තාව යොමු කිරීමේ දී ලිත් වර්ෂ පදනමින් යොමු කිරීමට කාරුණික වන්න.

**ඇමුණුම 03**

## සංවර්ධන නිලධාරීන්ගේ උපාධි සහතික සනාථ කර ගැනීමේදී ආයතන ප්‍රධානීන් අදාළ විශ්ව විද්‍යාල වෙතින් විමසිය යුතු කරුණු

- නම :
- ලියාපදිංචි අංකය:
- විභාග අංකය:
- අවසන් විභාගය පවත්වන ලද වර්ෂය සහ මාසය:
- ශිෂ්‍යභාවය:
- සාමාර්ථය:
- ලබාගත් උපාධිය:
- උපාධිය වලංගු වන දිනය: